(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 9(1).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 ජූලි මස 26 වැනි සිකුරාදා**

## 2013 අගෝස්තු මස 21 වැනි බදාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2602/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 65 වැනි පිටුවේ සඳහන් නීතිය හා සාමයට අදාළ ප්‍රශ්න තවමත් නොවිසඳී ඇති බවටත්, අවිගත් කණ්ඩායම් උතුරේ හා නැගෙනහිර විවිධ අපරාධ කරන බවටත්, පොලීසිය දේශපාලනීකරණය වී ඇති බවටත් වන ප්‍රකාශයන් පිළිබඳව රජයේ ප්‍රතිචාරය කවරේද;

(ii) එම කොමිෂන් සභා වාර්තාවේ ගිනි අවි පාවිච්චියත් සමග දේශපාලන ප්‍රචණ්ඩත්වය ඉහළ යාම සිදුවී ඇති බවට සඳහන්ව ඇති බැවින් එම තත්ත්වය සමනය කිරීමට ක්‍රියාමාර්ගයක් ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනක සිට ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2930/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උක් පර්යේෂණ ආයතනයේ උඩවලව කාර්යාලයට 2010 වර්ෂයේදී ආසන 26 ක් සහිත බස් රථයක් සහ කෲ කැබ් රථයක් මිලදී ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම එක් එක් වාහනය මිලදී ගැනීමට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා මහ භාණ්ඩාගාර අනුමතිය ලබාගෙන තිබුනේද;

(iii) එසේ නම්, එම එක් එක් වාහනය මිලදී ගැනීම සඳහා මහ භාණ්ඩාගාරය අනුමතිය ලබා දී තිබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වාහන දෙක සඳහා වැය කරන ලද මුදල භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලද මුදල ඉක්මවා තිබේ නම්, අතිරේක මුදලක් වැය කිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගත් පදනම කවරේද;

(v) ඉහත ගනුදෙනුව සම්බන්ධ අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, ඊට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2940/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාවේ සාමාජිකයින් ගණනාවක් විසැහවිල්ලේ සිටින බව වාර්තාවීමට හේතු කවරේද;

(ii) එසේ විසැහවිල්ලේ සිටින යුද හමුදා සාමාජිකයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන තිබේද; එසේ නැතහොත්, ඔවුන්ට සමාව ලබාදීමක් හෝ ඔවුන් විසින් ගෙවිය යුතු දඩ මුදල් අඩු කිරීමක් සිදු කර තිබේද;

(iii) එසේ සමාව ලබාදී නොමැති නම්, ඔවුන්ට විරුද්ධව නීතිමය හෝ අධිකරණමය ක්‍රියාමාර්ගවලට එළැඹ තිබේද;

(iv) එසේ නම්, එලෙස පලාගොස්, නීතිමය ලෙස අධිචෝදනා ලැබ සිටින හමුදා සාමාජිකයින් සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා යුද හමුදාවේ සාමාජිකයින් ක්‍රියාන්විතයේදී අතුරුදහන්වීම හෝ විසැහවිල්ලේ සිටීම හේතුවෙන් යුද හමුදාවට ඉතිරිවී ඇති මුදල් ප්‍රමාණය කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2965/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 සහ 2011 වර්ෂවලදී උපාධිධාරීන් සියලු දෙනාටම රැකියා ලබා දෙන බව පවසමින් ඔවුන් සම්මුඛ පරීක්ෂණවලට කැඳවා ඇති බවත්;

(ii) එම පිරිසෙන් කොටසකට පමණක් පුහුණුව සඳහා අවස්ථාව ලබා දී ඇති බවත්;

(iii) එම පුහුණුව ලැබූ උපාධිධාරීන්ගෙන් තෝරාගත් කොටසකට පමණක් රැකියා අවස්ථා ලබාදීම සඳහා දේශපාලන බලපෑම් මත කටයුතු සම්පාදනය කරමින් සිටින බවත්;

(iv) පුහුණුව ලැබූ අනෙකුත් උපාධිධාරීන් රැකියා වියුක්තිව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 සහ 2011 වර්ෂවලදී ඉහත සඳහන් සම්මුඛ පරීක්ෂණවලට කැඳවා ඇති උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) සම්මුඛ පරීක්ෂණවලින් පසුව පුහුණුව සඳහා තෝරාගත් උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපාධිධාරීන්ට දේශපාලන බලපෑම් මත රැකියා ලබාදීමට ක්‍රියාකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගනු ලබන්නේද;

(iv) පුහුණුව ලැබූ සියලුම උපාධිධාරීන්ට කිසිදු බලපෑමකට යටත් නොවී රැකියා අවස්ථා ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3261/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රජයට පවරාගත් ඉඩම්වල දළ තක්සේරු වටිනාකම හා භූමි ප්‍රමාණය කොපමණද;

(ii) පවරාගත් එම ඉඩම් අයත් ප්‍රදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව සහ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල නම් කවරේද;

(iii) කටුනායක අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පවරාගත් ඉඩම්වල වටිනාකම දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3342/'12

ගරු පී. හැරිසන් මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේදී මාවිල්ආරු වගා හානි වෙනුවෙන් ගොවි විශ්‍රාම වැටුපෙන් මුදල් ගෙවීම් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ගෙවීම් කරනු ලැබූ ගොවීන් සංඛ්‍යාව, එක් ගොවි මහතෙකුට ගෙවන ලද මුදල සහ ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

(iii) එම මුදල් ගෙවීමේදී වංචාවන් සිදුවී තිබේද;

(iv) එසේ නම්, එම වංචා සිදුකළ අයට දඬුවම් ලබාදී තිබේද;

(v) ලබා දුන් එම දඬුවම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3410/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010, 2011 සහ 2012 වර්ෂවලදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයින් විසින් ආපදා ණය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදි ආපදා ණය ලබා දී ඇති එම දෙපාර්තමේන්තුවේ සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් වර්ෂයේදී ආපදා ණය ලෙස ලබාදී ඇති මුළු මුදල කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3413/'13

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වව්නියාව, සෙට්ටිකුලම්හි සිවබාලන් සත්‍යාකාර යන අය අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කර තිබේද;

(ii) එසේ නම්, ඔහු සිටින බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාරගත කර සිටින්නේ සිරකරුවෙකු ලෙසද; සැකකරුවෙකු ලෙසද;

(iv) ඔහුට එරෙහිව අධිකරණයක නඩු පවරා තිබේද;

(v) එසේ නම්, නඩු පැවරූ දිනය, අදාළ අධිකරණය, නඩු අංකය හා නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(vi) නඩු පවරා ඇති චෝදනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සිවබාලන් සත්‍යාකාර යන අය නිදහස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3445/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේ නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම විභාගය සමත් වූ අයගේ නම් සහ එක් එක් අපේක්ෂකයා ලබා ගත් ලකුණු ඇතුළත් ලේඛනයක් විභාගයට පෙනී සිටි මාධ්‍ය අනුව, වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම විභාගයට පෙනී සිටි අපේක්ෂකයින් අතර සමත්වීම, අසමත්වීම සම්බන්ධයෙන් මේ වන විට විවිධ වූ චෝදනා හා කථාබහ පැතිරෙන බැවින් එම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කරවීමට විභාග කොමසාරිස්වරයාට උපදෙස් දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3468/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකාර්මික හා කාර්මික දැනුම ජනතාවට ලබාදීමේ අරමුණින් ගල්ඔය ව්‍යාපාරයට සමගාමීව 1950 දශකයේදී ආරම්භ කළ හාඩි උසස් තාක්ෂණික විද්‍යාලය (Hardy Advanced Technical College) පවත්වාගෙන යෑමේ වත්මන් අරමුණු කවරේද;

(ii) හාඩි උසස් තාක්ෂණික විද්‍යාලය 1997 වර්ෂයේදී හාඩි තාක්ෂණ විද්‍යාලය හා හාඩි උසස් තාක්ෂණ විද්‍යාලය යනුවෙන් කොටස් දෙකකට වෙන් කිරීමේ අරමුණු කවරේද;

(iii) හාඩි උසස් තාක්ෂණික විද්‍යාලය මගින් මේ වනවිට පවත්වනු ලබන පාඨමාලාවන් කවරේද;

(iv) 2013 අයවැය ඇස්තමේන්තුවලින් මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති ඉහත ආයතනය වෙත මුදල් වෙන් කර ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතට ඉතාමත් වැදගත් අධ්‍යාපන ආයතනයක් වන හාඩි උසස් තාක්ෂණ විද්‍යාලයේ පාඨමාලා සංවර්ධනය පළාතේ තරුණ පරම්පරාවට සුදුසු වන සේ සකස් කිරීමට පියවර ගන්නේද;

(ii) ඒ පිළිබඳව සාකච්ඡා කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3581/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික සේවක සංගමයේ සාමාජිකත්වය දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල සේවක සේවිකාවන්ගෙන් මාසිකව අයකරනු ලබන එකී සංගමයේ සාමාජික මුදල් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් සමහර සේවා ස්ථාන විසින් 2005 වර්ෂයේ සිට මේ දක්වා එම සංගම් මූලස්ථානය වෙත ලබා දී නොමැති බව දන්නේද;

(ii) එම සාමාජික මුදල් ඇතුළුව ගෙවීමට ඇති සියලුම මුදල් ජාතික සේවක සංගමයට ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3596/'13

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා කැස්බෑව ප්‍රදේශයෙන් පවරාගනු ලබන ඉඩම්වල හිමිකරුවන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) එම පුද්ගලයින්ගෙන් පවරා ගැනීමට කටයුතු කරන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්වල වගා කර ඇති කෘෂි භෝගයන් සම්බන්ධව ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3656/'13

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තනයේ පිටු අංක 47 යටතේ ආබාධිත, වයෝවෘද්ධ සමෘද්ධිලාභියෙකු සිටින පවුල් සඳහා රුපියල් 3000/- ක මාසික දීමනාවක් ලබා දෙන බවට සඳහන්ව ඇති බවත්;

(ii) මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි පිටු අංක 193 අනුව එය තහවුරු කර ඇති බවත්;

(iii) ඉහත සඳහන් ප්‍රකාශයන් අනුව හිමිවන දීමනාව ලබා ගැනීම සඳහා ආබාධිත තත්ත්වයේ පසුවන සමෘද්ධි සහනාධාරලාභියෙකු වන කුරුණෑගල බමුණාකොටුව, කඩිහාරයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. බී. ඒ. වීරසේකර මහතා 2012.05.14 දින දුබලතා ඇති පුද්ගලයන් සඳහා වන ජාතික ලේකම් කාර්යාලයට අයදුම්පතක් යොමු කර ඇති බවත්;

(iv) එම අයදුම්පත මේ වන විට පොරොත්තු ලේඛනයට ඇතුලත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) රුපියල් 3000/- ක දීමනාව ලබාගැනීමට 2012.05.21 දින සිට පොරොත්තු ලේඛනයේ සිටින වීරසේකර මහතාට එම දීමනාව ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3772/’13

ගරු විජිත බේරුගොඩ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය අර්ධද්වීපය තුළ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ අරමුණ කුමක්ද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට බලාපොරොත්තු වන කාල වකවානුව කවරේද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභ ලබන පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කරන ලද වියදම කොපමණද;

(v) මේ වන විට එම ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කර ඇති මුදල කොපමණද;

(vi) එම වියදම දරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3858/’13

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාල සීමාව තුළ,

(i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්;

(ii) මධ්‍යම පරිසර අධිකාරිය මගින් ඉටු කරන ලද සේවාවන්;

(iii) සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් කළ සේවාවන්;

(iv) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් ගත් ක්‍රියාමාර්ගයන්;

(v) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ ආයතනය මගින් ඉටුකළ මහජන සේවාවන්;

කවරේද යන්න වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 අගෝස්තු මස 22 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2603/’12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 66 වැනි පිටුවේ ඇති ඊළාම් ජනතා ප්‍රජාතාන්ත්‍රවාදී පක්ෂයට (EPDP) එරෙහිව ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පරීක්‍ෂණයක් නොපැවැත්වීම තුළින් වැරදි කරන්නන්ට දඬුවම් නොකරන බවට හැඟීමක් ඇති විය හැකි බවට වන සඳහන පිළිබඳව; සහ

(ii) නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධයෙන් සිය අන්තර් නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොවීම පිළිබඳව එම කොමිෂන් සභාව කණගාටුව ප්‍රකාශ කරන බවට වන සඳහන පිළිබඳව;

රජයේ ප්‍රතිචාරය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2932/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උක් පර්යේෂණ ආයතනයේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් දැනට ලබන දීමනා ඇතුළු වරප්‍රසාද කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක් පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක ආචාර්ය එන්. ඩී. කුමාරසිංහ මහතාට ලබා දෙනු ලබන මාසික වැටුප, දීමනා සහ අනෙකුත් වරප්‍රසාද කවරේද;

(ii) 2012 ජනවාරි සිට මේ දක්වා ඔහුගේ ස්ථිර සේවා ස්ථානය කවරේද;

(iii) ආචාර්ය එන්. ඩී. කුමාරසිංහ මහතාගෙන් පසුගිය කාලසීමාව තුළදී උක් පර්යේෂණ ආයතනයට ලබා ගන්නා ලද සේවය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2941/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලීසියේ 2012 ජූලි මස පළමු වැනි දින වනවිට සහ අද වනවිට අතුරුදහන්ව ඇති හෝ සේවයට වාර්තා කර නොමැති දෙපාර්තමේන්තුවේ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එලෙස විසැහවිල්ලේ සිටීමට හේතු කවරේද;

(iii) එලෙස විසැහවිල්ලේ සිටින පොලිස් නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන හෝ ඔවුන්ට සමාව ප්‍රදානය කොට හෝ ඔවුන් ගෙවිය යුතු දඩ මුදල් අඩුකොට හෝ තිබේද;

(iv) සමාව ප්‍රදානය කොට නොමැති නම්, නීතිමය හෝ උසාවි ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(v) එසේ නම්, නීතිමය වශයෙන් අධි චෝදනා ගොනු කරනු ලැබූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් ක්‍රියාන්විතයේ යෙදී සිටියදී අතුරුදහන් වීම හෝ විසැහවිල්ලේ සිටීම හේතුවෙන් ඉතිරි වී ඇති මුදල් ප්‍රමාණය කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3059/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උපාධිධාරී අභ්‍යාසලාභී භික්ෂූන්වහන්සේලා සඳහා රාජ්‍ය සේවයේ පත්වීම් ලබාදීමට මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

(ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටි 580ක් පමණ භික්ෂූන්වහන්සේලාගේ පත්වීම් අහෝසිකර අර්ධ රාජ්‍ය පිරිවෙන් පත්වීම්වලට පමණක් භික්ෂූන්වහන්සේ සීමාකිරීමේ අමාත්‍ය මණ්ඩල තීරණයකට එළැඹී ඇති බවත්;

(iii) එම තත්ත්වය හේතුවෙන් විශාල ශාසනික අර්බුදයක් නිර්මාණය වීමට ඉඩකඩ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට සිටින රැකියා වියුක්ත උපාධිධාරී අභ්‍යාසලාභී භික්ෂූන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) අර්ධ රාජ්‍ය පිරිවෙන් පත්වීම්වල සේවයට පමණක් උපාධිධාරී භික්ෂූන්වහන්සේලා සීමා කිරීමට එළැඹී අමාත්‍ය මණ්ඩල තීරණය අහෝසි කිරීමට පියවර ගන්නේද;

(iii) උපාධිධාරී භික්ෂූන්වහන්සේලාට කඩිනමින් රාජ්‍ය සේවය තුළ පත්වීම් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3348/'12

ගරු පී. හැරිසන් මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3411/'13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හා ඌන උපයෝගීතා වත්කම් පුනරුදය සඳහා පත්කර ඇති වන්දි විනිශ්චය සභාවේ සාමාජිකයින් කවුරුන්ද;

(ii) එම එක් එක් සාමාජිකයා තම සේවා සැපයීම වෙනුවෙන් මෙතෙක් ලබා ගෙන ඇති වැටුප් හෝ දීමනා ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන් ඉහත තනතුරු ලැබීමට පෙර 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරි ව්‍යවසායන් සහ ඌන උපයෝගීතා වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ රජයට පවරා ගන්නා ලද ආයතන එකක් හෝ කිහිපයක් වෙනුවෙන් පෞද්ගලිකව වෘත්තීමය සේවාවන් සපයා තිබේද;

(iv) එසේ නම්, එම අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3414/'13

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම, පේසාලේහි රාමසාමි ප්‍රැන්සිස් රංජන් යන අය අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කර තිබේද;

(ii) එසේ නම්, ඔහු සිටින බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාරගත කර සිටින්නේ සිරකරුවෙකු ලෙසද, සැකකරුවෙකු ලෙසද;

(iv) ඔහුට එරෙහිව අධිකරණයක නඩු පවරා තිබේද;

(v) එසේ නම්, නඩු පැවරූ දිනය, අදාළ අධිකරණය, නඩු අංකය සහ නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(vi) නඩු පවරා ඇති චෝදනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රාමසාමි ප්‍රැන්සිස් රංජන් යන අය නිදහස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3466/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුපියල් කෝටි 27කට වැඩි වටිනාකමකින් යුත් කිරිපිටි ටොන් 450කට අධික ප්‍රමාණයක් විකිණීම සඳහා මිල්කෝ සමාගම විසින් ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම කිරිපිටි වෙළඳපොළට ඉදිරිපත් නොකර පිටස්තරව විකිණීමට තීරණය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලෝක සෞඛ්‍ය සංවිධාන ප්‍රමිතීන්ට අනුව කිරිපිටි නිෂ්පාදනයේදී හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් යොදා ගත හැකිද;

(ii) ඉහත කිරිපිටි තොගයේ හයිඩ්‍රජන් පොරොක්සයිඩ් මිශ්‍රවී තිබේද;

(iii) එහි අඩංගු හයිඩ්‍රජන් පොරොක්සයිඩ් ප්‍රමාණය පිළිබඳ පරීක්ෂා කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) එම ප්‍රමාණය මනුෂ්‍ය පරිභෝජනයට සුදුසුද;

(vi) ඉහත සඳහන් කිරිපිටි තොගය වක්‍ර ක්‍රම මගින් නැවත මහජනයා අතරට යා හැකි බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම කිරිපිටි තොගය විකිණීම මිල්කෝ සමගමේ කිරිපිටි නිෂ්පාදනයට බලපෑමක් ඇති නොකරන්නේද;

(ii) මෙම කිරිපිටි තොගය නිෂ්පාදනයට වැය කළ මුදල කොපමණද;

(iii) අලෙවිකරනු ලබන ඉහත කිරිපිටි තොගය වෙනුවට අමතර කිරිපිටි නිෂ්පාදනය කිරීමේදී ඉහළ නිෂ්පාදන ධාරිතාවයක් ලබා ගැනීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3469/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදු කරන ලද රටවල නම් කවරේද;

(iii) එම එක් එක් සංචාරය සඳහා වැය වූ මුළු මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් සංචාරයේදී ජනාධිපතිතුමා සමග සංචාරයට එක් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම එක් එක් සංචාරයේදී කරන ලද සාකච්ඡා සහ අත්සන් කරන ලද ගිවිසුම් කවරේද;

(vi) එම එක් එක් සංචාරය, සාකච්ඡාව හා ගිවිසුම මගින් රටට අත්වූ හෝ අත් වෙමින් ඇති හෝ අත් වෙතැයි අපේක්ෂිත ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3583/'13

ගරු සුජීව සේනසිංහ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින්ගේ අවම මූලික වැටුප් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2012.03.16 දින සිට ශ්‍රී ලංගම සේවකයින්ගේ මූලික වැටුප 39%කින් වැඩි කිරීමට තීරණය කළ බව පිළිගන්නේද;

(ii) එම වැටුප් වැඩිකිරීම ලබාදීමට මේ වන විට පියවර ගෙන තිබේද;

(iii) එසේ නොමැතිනම් හිඟ වැටුප් සමග එම වැටුප් වැඩිවීම ලබාදීමට පියවර ගන්නා දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3778/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් ජනතාව වෙත "ඩිමෝ බට්ටා"ලොරි රථ ලබාදීමේ අරමුණ කවරේද;

(ii) එම ලොරි රථ ලබාදීමේ නිර්නායක කවරේද;

(iii) එකී නිර්නායක පාදකකොට ගෙන මේ වන විට ලබාදී ඇති ලොරි රථ සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් ලොරි රථයක වටිනාකම කොපමණද;

(v) එම ලොරි රථ ලබාදීමේ ක්‍රමවේදය නොකඩවා පවත්වාගෙන යන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ලොරි රථ බැංකු ණයක් මගින් ලබා දෙන්නේ නම්, අදාළ බැංකුකරුවන් කවුරුන්ද;

(ii) එම ණය මුදල ලබා දෙන්නේ පොලී සහිතවද; නැතහොත්, පොලී රහිතවද;

(iii) එම ණය වාරිකයක අගය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3859/'13

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය මගින් ක්‍රියාත්මක කෙරෙන,

(i) "නැණසල" ව්‍යාපෘතිය ආරම්භ කිරීමට තුඩු දුන් හේතු කවරේද;

(ii) දැනට ක්‍රියාත්මක වන නැණසල මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) නැණසල ව්‍යාපෘතිය මගින් ලබා දෙන පුහුණුවේ විශේෂත්වය කුමක්ද;

(iv) නැණසල ව්‍යාපෘතියේ අනාගත සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3861/'13

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2005 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ 'ඉ - ශ්‍රී ලංකා' සංවර්ධන ව්‍යාපෘතිය මගින්,

(i) රාජ්‍ය අංශය ප්‍රතිනිර්මාණය කිරීම තුළින් ලබා ගත් සාර්ථක ප්‍රතිඵල කවරේද;

(ii) තොරතුරු තාක්ෂණ කර්මාන්ත සංවර්ධනය හා කුඩා හා මධ්‍යම ව්‍යවසාය තරඟකාරීත්වය තුළින් ලබා ගත් සාර්ථක ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 'ඉ - ශ්‍රී ලංකා' සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති ජාත්‍යන්තර සම්මාන හා ජයග්‍රහණ කවරේද;

(ii) එම වැඩසටහන යටතේ සැලසුම් කර ඇති අනාගත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3864/'13

ගරු මනුෂ නානායක්කාර මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගා කිරීමේ මණ්ඩලයේ මූලිකත්වයෙන් පොල් වගා කරන ප්‍රදේශවල පිහිටුවා ඇති කප්රුක සමිතිවලට පැවරෙන වගකීම කවරේද;

(ii) මේ වන විට කප්රුක සමිතිවලට බැඳී ඇති සාමාජික සංඛ්‍යාව කොපමණද;

(iii) දීප ව්‍යාප්තව කප්රුක සමිති පිහිටුවීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, දිවයින පුරා කප්රුක සමිති පිහිටුවා අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) කප්රුක පුරවර වැඩසටහන යනු කුමක්ද යන්න එතුමා මෙම සභාවට පැහැදිලි කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 අගෝස්තු මස 23 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2604/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 69 වන පිටුවේ සඳහන් රාජ්‍ය නිලධාරීන් පත්කිරීම්, මාරු කිරීම් ආදිය සම්බන්ධයෙන් බලයේ සිටින පක්ෂයේ දේශපාලනඥයින් ඇඟිලි ගැසීම තැති ගන්වන සුළු ප්‍රපංචයක් ලෙසට කර ඇති හැඳින්වීම පිළිගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කොමිෂන් සභාව විසින් ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් නොපමාව පත්කළ යුතු බවට දැඩි ලෙස කරන ලද නිර්දේශය ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම කොමිසම පත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2933/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ලිවල බටහිර ග්‍රාම නිලධාරී වසම තුළ අභිමානගම නිවාස ක්‍රමය පිහිටා ඇති බවත්;

(ii) 1985 වර්ෂයේ දී ලංකාවේ ප්‍රථම නාගරික වනෝද්‍යානය ලෙස වැලිගම අභිමානගම නිවාස ව්‍යාපෘතියට ආසන්න ඉඩමක් ප්‍රකාශයට පත්කර ඇති බවත්;

(iii) වනෝද්‍යානය සහිත එම ඉඩම 2012 මැයි 23 දින දිනමිණ පුවත්පතේ පළකරන ලද දැන්වීමක් මගින් විකිණීම සඳහා කටයුතුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම නාගරික වනෝද්‍යානය විකිණීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2943/'12

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හි,

(i) අය-වැය තුළින් අධ්‍යාපනය සඳහා වෙන් කරන ලද අරමුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අධ්‍යාපනය වෙනුවෙන් වියදම් කරන ලද තථ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණයන් තථ්‍ය ලෙස වියදම් කරන ලද්දේ කුමන ශීර්ෂයන් යටතේද;

(iv) අධ්‍යාපනය වෙනුවෙන් මාසිකව වියදම් කරන ලද මුදල් ප්‍රමාණය සහ එම මුදල පවරා ඇති ශීර්ෂයන් කවරේද;

(v) අය-වැය මගින් අධ්‍යාපනය වෙනුවෙන් වෙන් කරන ලද මුදල පවරනු ලැබ ඇති ශීර්ෂයන් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3265/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මිල්කෝ සමාගමේ අඹේවෙල ශාඛාවේ කිරි ගබඩා කර තැබීමේ පහසුකම් නොමැති බව දන්නේද;

(ii) අඹේවෙල ශාඛාවේ ගබඩා පහසුකම් නොමැතිවීම නිසා කිරිපිටි නිපදවීම සඳහා ක්‍රීම් බවට පත්කර තිබියදී ඉවත් කරන ලද කිරි ලීටර් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කිරිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිල්කෝ සමාගමේ මාසික ආදායම සහ ශුද්ධ ලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3349/’12

ගරු පී. හැරිසන් මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3412/’13

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වේරැස් ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය නමින් ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික ඉඩම් රජයට පවරා ගැනීමට අපේක්ෂා කරන්නේද;

(ii) එකී ව්‍යාපෘතිය සඳහා අත්පත් කර ගැනීමට අපේක්ෂිත ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එකී ව්‍යාපෘතිය මගින් ඉටු කරවා ගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රජයට පවරා ගන්නා ඉඩම් සඳහා වන්දි ගෙවීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3415/'13

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රියන්ත ගුණරත්න නැමැත්තෙකු අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කර තිබේද;

(ii) එසේ නම්, ඔහු සිටින බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාර ගතකර සිටින්නේ සිරකරුවෙකු ලෙසද, සැකකරුවෙකු ලෙසද;

(iv) ඔහුට එරෙහිව අධිකරණයක නඩු පවරා තිබේද;

(v) එසේ නම්, නඩු පැවරූ දිනය, අදාළ අධිකරණය, නඩු අංකය හා නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(vi) නඩු පවරා ඇති චෝදනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ප්‍රියන්ත ගුණරත්න යන අය නිදහස් කිරීමට කටයුතු කරන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3441/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2013 ජනවාරි මාසයේදී පමණ හම්බන්තොට වරාය සඳහා ඇ.ඩො. මිලියන 153 ක අතිරේක ණය මුදලක් චීනයෙන් ලබාගෙන ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ණය මුදල ලබා ගත් නියමයන් සහ කොන්දේසි (පොලී අනුපාතය, ණය ආපසු ගෙවීම සඳහා ලබා දෙන කාලය, අනෙකුත් ගාස්තු) කවරේද;

(ii) මෙම ණය මුදල ලබාගත් බැංකුව කවරේද; සහ කිසියම් දේශීය හෝ විදේශීය තැරැව්කරුවන් යොදා ගනු ලැබුවේද;

(iii) හම්බන්තොට වරාය සඳහා සියලුම මූලාශ්‍රවලින් ලබා ගෙන ඇති සම්පූර්ණ ණය මුදල එක් එක් මූලාශ්‍රයට අදාළ නියමයන් සහ කොන්දේසි ද ඇතුළුව කවරේද;

(iv) මුල් ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් පසුව ඉහත (iii)හි සඳහන් ණය කොන්දේසි කිසිවක් කිසියම් අවස්ථාවක වෙනස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3513/'13

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිබ්බටුමුල්ල කණිෂ්ඨ විද්‍යාලය වර්ෂ කීපයක සිට වසා දමා ඇති බවත්;

(ii) එම විදුහල් භූමිය හා ගොඩනැගිලි සම්බන්ධව පළාත් සභාව හෝ මධ්‍යම රජය මෙතෙක් කිසිදු අවධානයක් යොමු නොකළ බවත්;

(iii) ඒ හේතුවෙන් ඇතැම් පිරිස් විදුහල් භූමිය අත්පත් කරගනිමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 1975 වර්ෂයේදී ආරම්භ කළ එම විදුහලට අයත් භූමි ප්‍රමාණය, ගොඩනැගිලි සංඛ්‍යාව සහ අනෙකුත් භෞතික සම්පත් කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) තිබ්බටුමුල්ල කණිෂ්ඨ විද්‍යාලය වසා දැමූ දිනය කවරේද;

(ii) එය වසා දමන අවස්ථාවේ ඉගෙනුම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවය කළ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වසා දැමීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) වසා දමා ඇති මෙම පාසල සංවර්ධනය කර නැවත ආරම්භ කිරීමට හෝ විදුහල් භූමිය හා එහි ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුත්තකට යොදා ගැනීමට පියවර ගන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

3536/'13

ගරු ඒ. විනායගමූර්ති මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු පළාත තුළ දෙමළ ජාතික සන්ධානය (TNA) මගින් පාලනය කරනු ලබන පළාත් පාලන ආයතනවලින් ලබාගෙන එම පළාතේ ආණ්ඩුකාරවරයාට දෙනු ලැබූ මුදල් පිළිබඳ තොරතුරු කවරේද;

(ii) පළාත් පාලන ආයතනවලින් මෙම මුදල් ලබා ගත්තේ කාගේ නියෝගය මතද;

(iii) එකී මුදල් ලබා ගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3601/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොරියානු රැකියා අවස්ථා සඳහා 2012 වර්ෂයේ පැවැත්වූ කොරියානු භාෂා විභාගයෙන් සමත් වූ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් අතරින් 2012 වර්ෂය තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා කොරියානු රැකියා සඳහා පිටත්ව ගොස් ඇති ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ යවනු ලැබූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3779/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වැඩ අවසන් කර ඇති මොරටුව/පානදුර, අඹතලේ හා මීගමුව යන ප්‍රදේශවලට ජල පිරිපහදු පහසුකම් සැපයීමේ ව්‍යාපෘතියේ අරමුණ කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මගින් ආවරණය වූ ප්‍රදේශ කවරේද;

(iii) එහි වැඩ අවසන් කරන ලද දිනය කවරේද;

(iv) ඉන් ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව කොපමණද;

(v) එම ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(vi) එම මුදල් වැය කරන ලද ආයතන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3860/'13

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ක්‍රියාත්මක කෙරෙන ජාල සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

(ii) එම ආයතනය රජයේ ව්‍යාපෘතීන් සඳහා ලබාදෙන ලද දායකත්වය කවරේද;

(iii) දැනුම පිළිබඳ වූ වටිනාකම ව්‍යාප්ත කිරීම සඳහා දරන ලද දායකත්වය කවරේද;

(iv) එම ආයතනයේ ඉදිරි සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3862/'13

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල වැවිලි සමාගම යටතේ පාලනය වන වතු කවරේද;

(ii) එම එක් එක් වත්තේ භූමි ප්‍රමාණය හා කරනු ලබන ප්‍රධාන වගාවන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ගතවූ ආසන්නතම අවුරුදු 10 තුළ එක් එක් වත්තෙන් ලැබූ ආදායම හා ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3865/'13

ගරු මනූෂ නානායක්කාර මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයේ දියුණුවට අදාළව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය, පොල් වගා කරන වෙනත් රටවල් සමග අන්තර් ජාතික සබඳතාවයක් ඇති කර ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි සබඳතා ඇතිකර ගෙන ඇති රටවල් කවරේද;

(iii) එම එක් එක් රට සමග අවබෝධතා ගිවිසුම්වලට එළැඹ තිබේද;

(iv) එම අවබෝධතා ගිවිසුම් ශ්‍රී ලංකාවේ පොල් කර්මාන්තයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?